## කවි කොළය



# මැතිවරණ උණුසුම!

බිහි වූ පජාතන්තර වාදයෙහි නමින්
මුලු රට වැසී ඇත අද මැතිවරණ දුමින්
දිවි වග වළස් මුලු සැගවුණු බැටලු හමින්
තොල කට ලොවති හිස ඔසවා ගොදුරු බිමින්

ලිස්සන ගසින් මෙන් බඩු මිළ පහත වැටේ
එකියන මිලට බඩු නැත කිසි තැනක රටේ
බන්ධුල කෑ ගසයි හම යන තුරුම කටේ
පැටවෙයි තවත් බර නැති බැරි අයගෙ පිටේ

පඩිපත නගී හමුදා විරුවනගෙ පවා
ඇරියස් දමනු ඇත ජනවාරියෙදි ගෙවා
මහ මන්දිරේ අරලිය ගස් තිබෙන වවා
හරියට වෙසක් දන්සැල මෙනි උදය හවා

තිබුණද උපාදිය - නැති අය හට රස්සා
දෙයි පත්වීම් කොතැනක හෝ හරි ගස්සා
විස්සට තිහට පෙර දිනවල තිබු උස්සා
බැංකුවෙ පොලිය ඇත බිංදුවටම බස්සා

නව වස මුලදි පළමුව ජනපති වරණේ
දෙවනුව මහා ඡන්දයෙ සමුදුරු තරණේ
රජයට ලැබෙයි හෙළ උරුමයෙ සඟ සරණේ
පොදු පුරුෂයෙක් මතුවී ඇත හෙළ දෙරණේ

වාසිය ලබා ගැනුමට පසුගිය යුද්දේ
වලිකති ඇසෙයි දෙපිළම ගොරවන සද්දේ
කිසි සටනකදි නැත දෙදෙනම ජය ලද්දේ
ජනතා තීන්දුව ඇත මේ දෙක මැද්දේ

පාලම් ගුවන් තොටු මාවත් අධි වේගී
හාබර් විදුලි නිපැයුම් හල් පරි බෝගී
ජනතා අයිතියට කළ රජයක් තෑගී
යාවිද මේ රටේ ජනමතයට පෑගී

ඇවිලුණ ගින්න තිස්
වසරක් කෙරුව නිමා
මහරජ විරිදු පද ලද
ගරු සෙනෙවි තුමා
හය මාසෙකින් අමතක
කොට ඉවත දමා
බැලුවොත් අහක ඒකට
දිය හැකිද සමා




♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# මේ අවිනීත තරුණිය ඔබ හඳුනනවාද?

## ඇයගේ නම
## උදෙය්ගි අපේක්ෂා හඟවත්ත



## Sacrilege of Buddha statue



See the above picture of a woman hugging a Buddha statue posing for a photo-shot. The Buddha face is sullied all over with her lipstick marks. Some other photos appeared on the web showed she was drinking with her pals before this depraved act. This ill-bred Sri Lankan woman known as **Udyogi Apeksha Hangawatta**, is currently living in the USA. Being passed out as a layer, she is now said to be working as a legal advisor for a private firm in New York.

**බු**දු පිළිමයක් බදාගෙන ඉන්නා මේ වලත්ත ගැහැණියගේ ඉරියව් දෙස බලන්න. ඇයගේ තොල්වල තිබුණු ලිප්ස්ටික් බුදුපිළිමයේ මුහුණ පුරා තැවරී ඇති සැටි දැකිය හැකිය. **උද්යෝගි අපේක්ෂා හඟවත්ත** යන නමින් යුත් මැය ලංකාවේ කුරුණෑගල ඉපදී දැන්ට එක්සත් ජනපදයේ නිවේඩාහි වාසය කරයි. ඉහත කී පින්තූරය සමග වෙබ් අඩවියක පළවූ අනෙක් පින්තූරවල වූයේ ඇය තවත් තරුණයින් දෙදෙනෙකු සමග බාර් එකක මත්පැන් බොමින් සිටින අවස්ථාවකි. මේ පින්තූරයේ ඇය එහිම නැටුමක යෙදී සිටින හැටිය. මැය ළඟදී නීතිඥ විභාගයෙන් සමත්ව දැන් නිව්යෝර්ක් නගරයේ පුද්ගලික ආයතනයක සේවය කරන බව දැනගන්නට ඇත.

# Malaysia plans to produce a special Muslims car

# මුස්ලිම් අයට විශේෂ කාර් එකක්

**By Robin Brant BBC News, Kuala Lumpur**



The Malaysian car-maker Proton has announced plans to develop an "Islamic car", designed for Muslim motorists.

The car could boast special features like a compass pointing to Mecca and a dedicated space to keep a copy of the Koran and a headscarf. The idea came during a visit to the Middle East by a delegation of Malaysian politicians and businessmen.

Safety features or fuel economy is one way of selling a car, but Proton thinks vehicles designed specifically for Muslims across the world represent a huge gap in the market. Proton is the most dominant car on the streets here but the company has suffered recently after the government allowed more foreign cars to be imported.

**මැ**ලේසියාවේ සුප්‍රකට ප්‍රෝටෝන් මෝටර් රථ නිෂ්පාදනය කරන සමාගම මුස්ලිම් භක්තිකයින් සඳහා විශේෂ මෝටර් රථයක් නිපදවීමට යන බව පැවසේ. මෙම නවතම ප්‍රෝටෝන් මෝටර් රථයේ මක්කම දෙසට යොමුවුණු දිශාව නිවැරදිව දක්වන කටුවක් ද, කුරානය සහ මුස්ලිම් හිස් වැස්ම තැබීම සඳහා වෙනම කුඩා අල්මාරියක්ද සවිකෙරෙනවා ඇත. මෙම මෝටර් රථය ලොව පුරා වෙසෙන මුස්ලිම් ජනතාව අතරේ ජනප්‍රිය වනු ඇතැයි ප්‍රෝටෝන් සමාගම විශ්වාස කරයි.



**ඉරිදා - SUN** ලංකාවෙ සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා ළඟදී කිව්වා, ලංකාවෙ මිනිස්සු මගුල් ගේකට රුපියල් ලක්ෂ අටක්, දහයක් වියදම් කරනවලු ලෝස් නැතුව. හැබැයි ලෙඩකට ලේ පරීක්ෂා කරන්න රුපියල් හාර සීයක් රජය ගන්නවයි කිව්වම, මිනිස්සු ආණ්ඩුවට බනිනවලු ජනතාව ගසා කනවයි කියලා. ප්‍රයිවට් නර්සිං හෝම් වලින් එක එක දේවල් පරීක්ෂා කරන්න ගියාම එතන ඉල්ලන ඕනම ගණනක් සද්ද නැතුව ගෙවලා එනවලු. හැබැයි අපි වියදම පියවගන්න සුළු ගණනක් ඉල්ලුවම ඒකට අපේ මිනිස්සු නාහෙන් අඬනවලු. සෞඛ්‍ය ඇමතිවරයගෙ ඒ කතාවෙ හරි ඇත්තක් තියනවා.

**සඳුදා - MON** ළඟදි බ්‍රිතාන්‍ය අගමැති ගෝඩ්න් බ්‍රවුන් මහත්තෙයට වෙච්ච දෙයක් නිසා මට ලංකාව මතක් වුණා. මේකයි සිද්ධිය. බ්‍රවුන් ඇප්ඝනිස්ථානයේ යුද්දෙට ගිය ඉංග්‍රීසි සොල්දාදුවෙක් වෙඩි වැදිලා මැරුණම, ඒ ගැන රජයේ කණගාටුව පළකරලා, අගමැති හැටියට, ඒ රණවිරුවගෙ අම්මට ලියුමක් යැව්වා.ඒ ලියුමෙ වචන ලියලා තිබුණු හැටි වැරදිය කියලා ඒ ගෑණු කෙනා, ඒ ලියුම, මෙහේ සන් පත්තරේට යැව්වා. සන්කාරයා ඒක මුල්පිටේ දැම්මා අගමැතිටත් ඉංග්‍රීසි වරදී කියලා. මං කල්පනා කළේ ඕක ලංකාවෙ දි උනානම් බ්‍රවුන්ට හූ කියනවා. කුණු බිත්තර ගහනවා. ලංකාවේදි සිංහළ වැරැද්දුවොත් ඒක උසස් දෙයක්. හැබැයි ඉංග්‍රීසි වචන යක් වත් වැරදුනොත් එහෙම ඉතින් ඉවරෙට ඉවරයි.

**කුජදා - TUE** අපේ රටට මේ වෙච්ච දේ ගැන හුඟක් දෙනා දුක් වෙනවා. සිංහළයා ගැන රොබට් නොක්ස් කියපු දේ මට දැනුයි තේරෙන්නෙ. අද මඩේ ඉන්න ලංකාවෙ සිංහළ ගොවියගෙ ඒ මඩ ටික හෝදලා ගත්තම රජකමට සුදුසුය කියලා උන්නැහේ කිව්වා. අපි කවුරුත් ඒක සිංහළයා ගැන කියපු මහා නම්බුකාර කීමක් හැටියට පිළිඅරන් හිටියෙ. ඒ කියමන ගැන තව ටිකක් හිතුවොත් රොබට් නොක්ස් මෙහෙමත් හිතුවා වෙන්න පුළුවන්. මොකක්ද දන්නවද? අද රජකමේ ඉන්න සිංහළයා හෙට දන්නෙම නැතුව මඩගොඩට වැටෙන්නත් පුළුවන්. ඊයෙ වීරයාට අද මඩ විදිනහැටි පේනව නේද?

**බුදදා - WED** මම මේ කල්පනා කළේ දේශපාලනේට බැස්සම ඕන දෙයක් ඇත්ත හරි බොරුව හරි කියන්න පුළුවන් බය නැතුව. අහන් ඉන්න මිනිස්සු කිසි කෙනෙක් ප්‍රශ්න කරන්නෙ නැහැ. බන්දුල ගුණවර්ධන කියනවා, බඩුමිළ ඉහළ යෑම ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් කියලා. තලවකැලේ නැන්දම්මා කියනවා, දරුවෝ, දැන් සෞඛ්‍ය අමාත්‍යංශෙ මහත්තුරු වගයක් ගමට ඇවිල්ලා කියලා ගිය විදියට මදුරුවො කන එකත් පිටරට කුමන්ත්‍රණයක්ලු. ලංකාව වගේ රටවල මදුරුවො බෝකරලා පිට රට ඇයො විදින බෙහෙත් ජාති විකුණගන්න හදනවලු. ඇත්ත වෙන්න ඇති. ඒ මිනිස්සු දන්න උදවිය නේ.

**ගුරුදා - THU** ලංකාවෙ දෙවන යුද්දෙ පටන් අරගෙන. ඒ කියන්නෙ ජනපතිවරණය. ඒකෙ අපේක්ෂකයෙක් වෙච්චිය කියලා කිසි කෙනෙක් හීනෙන්වත් නොහිතපු කෙනෙකුත් චන්දෙ ඉල්ලනවා. මේ සැරේ ඒ කාගෙත් අළුත්ම තේමාව දූෂණය නැතිකිරීම. මේ හාදයො හැමෝම අද කතාකරන්නෙ දූෂණය කියන්නෙ හරියට මේ දැන් අද දැක්ක දෙයක් වගේ. මෙච්චරකල් මොකක්ද කළේ? මේ ඡන්දෙ ආවම විතරක් හදිසියෙම දූෂණය නැති කරන්න කතා කරන්නෙ, ඇයි ඉතින් ඕක කලින් නොකළේ? ඔය දූෂණය නැතිකිරීමෙ මහා බොරුව අද ඊයෙ නෙවෙයි, ලෝකෙට දේශපාලනේ ආපු කාලෙ ඉඳලා දේශපාලුවො මතුරන මන්තරේ. මේ සම්මජාතියෙදි ඒක කරන්නෙනෑ.

**කිවිදා - FRI** මට පුදුම හිතෙන විස්තරයක් සහ පින්තූරයක් ළඟදි ලංකාදීප පත්තරේ පළවෙලා තිබුණා. ඒ මාතර ටවුමෙ බෝධිය ළඟ පිරිසක් රජය දිනවන්න හිතාගෙන බෝධි පූජාවක් කරනවා. ඒක ඉතින් සාමාන්‍ය දෙයක්. ඔය ඕන තරං මිනිස්සු බෝධි පූජා කරන්නෙ, පිරිත් කියන්නෙ, දෙවියන්ට පඬුරු ගැටගහන්නෙ, බාර හාර වෙන්නෙ, ඡන්ද දිනන්න, ලෙඩදුක් හොඳවෙන්න, විභාග පාස්කරන්න, ඔය හැම එකකටම. මෙතන ඇති විශේෂත්වය ඒ කිසි දෙයක් නෙවෙයි, ඒකට සහභාගිවෙලා හිටී කස්ටිය. මට හිනාත් ගියා. ඒ කස්ටිය තමයි මාතර කොමියුනිස්ට් පක්ෂ ශාඛාවෙ සාමාජිකයො. මම ජීවිතේ පළමුවෙනි වතාවටයි ඇහුවෙ කොමියුනිස්ට්කාරයො ඔහොම දේවල් කරනවා. ඒක මාක්ස්වාදෙට පටහැනියි. කාල්මාක්ස් හරි, ලෙනින් හරි අද දවසෙ හිටිය නම් මේ හාදයින්ට බනීවි පලු යන්න! සහෝදරයො දැන් හරි මගට ඇවිල්ලාවත්ද? අනේ මංකෙඳාක්කා!

**ශනිදා - SAT** ලංකාවෙ තරං දේශපාලකයො පක්ෂ මාරුකරන රටක් ලෝකෙ වෙන කොහේවත් නෑ. ඒ වැඩේට තඹ දොයිතුවක තරම් ලැජ්ජාවකුත් ඒ ගොල්ලන්ට නෑ. උන්ට ඡන්දෙ දෙන මිනිස්සුන්ටත් නෑ. අන්න එස්. බී. දිසානායක අද ආණ්ඩුවට පැන්නා. “ කමක් නෑ කවුරු ගියත්. මට දැන් හමුදාපති කෙනෙක් ඉන්නෙ. ඒ ඇති. ඉතින් මොකටද බයවෙන්නෙ? ” රනිල් ලොක්කා කිව්වලු.